# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1708/27 - 2011 ජුනි 02 වැනි බ්‍රහස්පතින්දා - 2011.06.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත

27අ වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ වූ නියමය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනුව්‍යවස්ථාව සමග කියවිය යුතු, 1981 අංක 39 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනත මගින් සංශෝධිත, ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 27අ වගන්තියේ (4) වැනි උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම,

(අ) 1958 අංක 4 දරන ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා පනත මගින් පිහිටු වන ලද ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට සතු කර ඇත්තා වූ ද, මෙම නියමයේ පළමු වන උපලේඛනයේ විස්තර කර ඇති, බෙන්තොට නොහොත් බෙන්තොට වත්ත යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන ඉඩම හා සම්බන්ධ 1994 අප්‍රේල් මස 21 වැනි දින අංක 815/10 දරන අති විශෙෂ ගැසට් පත්‍රවල පළ කරන ලද, ඉහත කී පනතේ 27අ වගන්තියේ (2) වැනි උපවගන්තිය යටතේ සාදන ලද, බෙන්තොට නොහොත් බෙන්තොට වත්ත යනුවෙන් සඳහන් කරනු ලබන සහ හඳුන්වන ලබන ඉඩමේ කොටසක් වන්නා වූ, මෙහි දෙවන උපලේඛනයේ නිශ්චිත ව දක්වා ඇති අටකොහොට වත්ත නැමති ඉඩමේ බිම් ප්‍රමාණයට අදාළ වන්නා වූ නියමයේ කොටස, එකී සංස්ථාව වෙත සතු කිරීම සඳහා වූ ප්‍රතිඥාවට අදාළ නියම හෝ කොන්දේසි අනුව ක්‍රියා කර නොමැති වීම හේතුවෙන්, ප්‍රත්‍යාදිෂ්ට කිරීම මගින් එම නියමයන් මෙයින් සංශෝධනය කරමි.

(ආ) එම ප්‍රත්‍යාදිෂ්ට කිරීමෙන් පසු ව, එකී ඉඩමේ බිම් ප්‍රමාණය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත නැවත සතු කර දෙන බව මෙයින් ප්‍රකාශ කරමි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2011ක් වූ මැයි මස 31 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

1A - G 14586— 340 (2011/06)

පළමු වන උපලේඛනය

බෙන්තොට හෙවත් බෙන්තොට වත්ත යනුවෙන් සඳහන් කරනු ලබන ඉඩමේ සම්පූර්ණ ප්‍රමාණය

| ගැසට් නිවේදනය පිළිබඳ විස්තර | ඉඩමේ නම | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙත පවරන ලද ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර්වලින් |
|---|---|---|---|---|
| 1994.04.21 දින අංක 815/10 | බෙන්තොට හෙවත් බෙන්තොට වත්ත | ගාල්ල | ඇල්පිටිය | 835.00 |

දෙවන උපලේඛනය

කොමිෂන් සභාව වෙත නැවත පැවරෙන ඉඩම් ප්‍රමාණය

| වෙන් කර දී ඇති විශේෂ අංකය | ඉඩමේ නම | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | කොමිෂන් සභාව වෙත නැවත පැවරෙන ඉඩම් කොටස |
|---|---|---|---|---|
| ක/181 | අටකොහොට වත්ත | ගාල්ල | ඇල්පිටිය | දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නවදගහ ගමේ පිහිටි, බලයලත් මිනින්දෝරු ටී.ඩී.ඩබ්.ජී.පෙරේරා මහතා විසින් 2004.11.13 දින සකස් කර ඇති, අංක 1290 B පිඹුරේ කැබලි අංක B වලින් පෙන්නුම් කර ඇති, උතුරට : මෙම ඉඩමේ කැබලි අංක A, නැගෙනහිරට : පන්සල් වත්ත, දකුණට : පන්සල් වත්ත, බටහිරට : කැබලි අංක A යන මායිම් තුළ පිහිටි අක්කර එකයි රූඩ් දෙකයි පර්චස් විසි එකයි දශම අටයි හතක (අක්: 01 රූඩ්: 2, පර්.21.87) බිම් ප්‍රමාණය. |

06-333

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.